පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

# අවසාන වාර පරීක්ෂණය - 2022

ශ්‍රේණිය: 06

විෂයය :- ...... බුද්ධ ධර්මය ......

පාසලේ නම : ........................................

ඇතුළත්වීමේ අංකය : ..........................

කාලය : පැය දෙකයි

## I පත්‍රය

- **පළමු කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **ප්‍රශ්න අංක 01 සිට 10 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. සිදුහත් කුමරු ඒකාන්තයෙන්ම බුදුවන බව ප්‍රථම වරට පවසනු ලැබුවේ,

    i. සර්වමිත්‍ර බමුණා ය. ii. කාලදේවල තවුසා ය. iii. කොණ්ඩඤ්ඤ තවුසා ය.

02. විදර්ශනා වඩා සියලු කෙලෙස් නසන නුවණ,

    i. පුබ්බේනිවාසානුස්සති ඥාණය යි. ii. චුතුපපාත ඥාණය යි. iii. ආසවක්ඛය ඥාණය යි.

03. සිදුහත් කුමරු සමඟ එකට හැදී වැඩුණු කුමාරයෙකි,

    i. කාළුදායි. ii. ඡන්න. iii. යස.

04. මඝ මානවක ඇතුලු පිරිස අනුගමනය කළ වතාවතකි,

    i. ක්‍රෝධ වීම. ii. ඇත්ත කතා කිරීම. iii. ආහාර පාන සපයා දීම.

05. සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන පරිදි දරුවන් විසින් දෙමාපියන් උදෙසා ඉටුකළ යුතු යුතුකමකි,

    i. යහපතේ පිහිටවීම. ii. පවින් වැළැක්වීම. iii. පිං අනුමෝදන් කිරීම.

06. බුද්ධ ශාසනයේ පැවිදි වූ මුල්ම ලාංකිකයා වන්නේ,

    i. භණ්ඩුක උපාසක ය. ii. අරිට්ඨ ඇමති ය. iii. මහා නාග ඇමති ය.

07. දිවා රාත්‍රී පිං වැඩෙන ක්‍රියාවකි,

    i. වන උයන් වැවීම. ii. පන්සිල් සුරැකීම. iii. මව්පිය උපස්ථානය.

08. සීල ශික්ෂාවට අයත් අංගයකි,

    i. සම්මා කම්මන්ත. ii. සම්මා සමාධි. iii. සම්මා සංකප්ප.

09. අත්ථස්සද්වාර ජාතකයේ "අලීනතා" ලෙස දක්වා ඇත්තේ,

    i. දැහැමි ව ජීවත් වීමයි. ii. කම්මැලි නොවීමයි. iii. නීරෝග බවයි.

10. සංඝමිත්තා තෙරණිය ඇතුලු පිරිස ලංකාවට වැඩම කළේ,

    i. ඇසළ පෝය දිනකය. ii. බිනර පෝය දිනකය. iii. උඳුවප් පෝය දිනකය.

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න සඳහා (අ) කොටසේ ප්‍රකාශයට වඩාත් ගැළපෙන අදහස (ආ) කොටසේ ප්‍රකාශයට තෝරා යා කරන්න.**

| (අ) | (ආ) |
|---|---|
| 11. කහ පාට සිංහයා | ස්වර්ණ හංස ජාතකය |
| 12. මහාභිනිෂ්ක්‍රමණය | සටීකාර බ්‍රහ්මයා |
| 13. සිවුරු පිරිකර පූජාව | සිංහල ජනතාවගේ විනය ගරුක බව |
| 14. දැඩි ලෝභය | හත්ථාලක මෙහෙණවර |
| 15. දේවානම්පියතිස්ස රජු | ඇසළ පෝය |

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවල දී ඇති වගන්තිය නිවැරදි නම් (√) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද යොදන්න**

16. පන්සිය පනස් ජාතක පොත් වහන්සේ රචනා වූයේ දඹදෙණි යුගයේදීය. ( )
17. සිල්වත්ව කටයුතු කිරීමෙන් මහත් වු භෝග සම්පත් ලැබේ. ( )
18. සිදුහත් කුමරුගේ ගුරුවරයා සර්වමිත්‍ර බමුණා ය. ( )
19. පන්සල් යෑම උපාසකයකු වීමේ මූලික පියවර යි. ( )
20. නීරෝගී බව දියුණු වීමේ දොරටුවක් නොවේ. ( )

( ලකුණු 2 × 20 = 40 )

* *

## II පත්‍රය

- **පළමු ප්‍රශ්නය ඇතුළත්ව තවත් ප්‍රශ්න 04කට පිළිතුරු සපයන්න**

01.

I. තුසිත දෙව්ලොව වැඩ සිටි බෝසතාණන් වහන්සේට දේවාරාධනය සිදු කළේ කවුද?

II. තම රාජ්‍යය දෙකට බෙදා පාලනය කිරීමට බෝසතාණන් වහන්සේට ආරාධනා කළේ කවුද?

III. සිගාලෝවාද සූත්‍රය දේශනා කළේ කවුරුන් උදෙසා ද?

IV. වෙනස් වීම බුදු දහමේ දී හඳුන්වන්නේ කුමන නමින් ද?

V. "පඨමක චේතිය" නමින් හඳුන්වන ස්තූපය කුමක් ද?

VI. ශ්‍රී මහා බෝධින් වහන්සේ මෙරටට වැඩම කරවීම හැදින්වෙන නම කුමක් ද?

VII. සම්පත් ආරක්ෂා කර ගැනීමට සම්බන්ධ උපදෙස් අඩංගු සූත්‍රය කුමක් ද?

VIIII. භාවනාව වැඩීම සඳහා ශිෂ්‍යයෙකු අසුන් ගත යුත්තේ කුමන ඉරියව්වෙන් ද?

IX. ජාතික කොඩියේ දැක්වෙන බෞද්ධ සංකේතය කුමක් ද?

X. ශ්‍රේෂ්ඨත්වය නිසා දෙමාපියන් හඳුන්වන ගෞරව නාමය කුමක් ද?

(ලකුණු 2 × 10 = 20 )

02.

I. යසෝධරා දේවිය විසින් බුදු සිරුර වර්ණනා කළ ගාථා හඳුන්වන නම කුමක්ද? (ලකුණු 02)

II. බුදුරජාණන් වහන්සේ රාහුල පොඩි හාමුදුරුවන්ට අවවාද ලබා දිමේ දී උපමාවට ගත් දේවල් දෙකක් නම් කරන්න. (ලකුණු 03)

III. රාහුල පොඩි හාමුදුරුවන්ගේ චරිතයෙන් ලබා ගත හැකි ආදර්ශ පහක් ලියන්න. (ලකුණු 05)

03.

I. පාසලක අනන්‍යතාව දැක්වෙන සංකේත දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II. ජාතික ගීයෙන් පෙන්වා දෙන බෞද්ධ සංකල්ප තුනක් ලියන්න. (ලකුණු 03)

III. ජාතික කොඩිය පරිහරණයේ දී සැළකිය යුතු කරුණු පහක් ලියන්න. (ලකුණු 05)

04.

I. පහත ගාථාව සම්පූර්ණ කරන්න. (ලකුණු 02)

.............................................. - සබ්බේසං ජීවිතං පියං

අත්තානං උපමං කත්වා - ...........................................

II. ඉහත ගාථාවේ සරල අදහස ලියන්න. (ලකුණු 03)

III. මෙත් වැඩීමේ ආනිශංස පහක් ලියන්න. (ලකුණු 05)

05.

I. මිහිඳු මහරහතන් වහන්සේ සමඟ ලංකාවට වැඩම කළ සාමණේරයන් වහන්සේ කවුද? (ලකුණු 02)

II. දේවානම්පියතිස්ස රජතුමා භික්ෂූන් වහන්සේලාට වැඩ සිටීම සඳහා පූජා කළ විහාරාරාම තුනක් නම් කරන්න. (ලකුණු 03)

III. මහින්දාගමනය නිසා ලාංකිකයන්ට ලැබුණු දායාද පහක් ලියන්න. (ලකුණු 05)

06.

I. පන්සලකට ගොස් වන්දනාමාන කිරීමට පෙර සිදුකරන ක්‍රියා හඳුන්වන නම කුමක්ද? (ලකුණු 02)

II. එසේ සිදුකරන ක්‍රියා තුනක් ලියන්න. (ලකුණු 03)

III. ත්‍රිවිධ චෛත්‍යය වඳින ගාථාව ලියන්න. (ලකුණු 05)

07.

I. ශ්‍රද්ධාවේ ප්‍රභේද දෙක ලියන්න. (ලකුණු 02)

II. ශ්‍රද්ධාවන්තයකුගේ දැකිය හැකි ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 03)

III. පහත වචන සඳහා ශාසනික වචන ලියන්න. (ලකුණු 05)

(අ). අතුගානවා (ආ). එනවා

(ඉ). බුලත්විට (ඊ). කෑමට ගන්නා පාන වර්ග

(උ). දිය නානවා

* * *

06 ශ්‍රේණිය

# පිළිතුරු

## I කොටස

01. ii. කාලදේවල තවුසා ය.

02. iii. ආසවක්ඛය ඤාණය යි.

03. i. කාළුදායි.

04. ii. ඇත්ත කතා කිරීම.

05. iii. පිං අනුමෝදන් කිරීම.

06. ii. අරිට්ඨ ඇමති ය.

07. i. වන උයන් වැවීම.

08. i. සම්මා කම්මන්ත.

09. ii. කම්මැලි නොවීමයි.

10. iii. උඳුවප් පෝය දිනකය.

11. කහ පාට සිංහයා - සිංහල ජනතාවගේ විනය ගරුක බව

12. මහාභිනිෂ්ක්‍රමණය - ඇසළ පෝය

13. සිවුරු පිරිකර පූජාව - සටීකාර බ්‍රහ්මයා

14. දැඩි ලෝභය - ස්වර්ණ හංස ජාතකය

15. දේවානම්පියතිස්ස රජු - හත්ථාලක මෙහෙණවර

16. × 17. √ 18. √ 19. × 20. ×

## II කොටස

01

I. සහම්පති මහා බ්‍රහ්මයා

II. බිම්බිසාර රජු

III. සිගාල ගෘහපතිට

IV. අනිත්‍යතාව

V. ථූපාරාමය

VI. දුමින්දාගමනය / බෝධි ආගමනය

VI. කුල සූත්‍රය

VIII. බද්ධ පර්යංකයෙන් / එරමිණියා ගොතාගෙන

IX. බෝ පත් සතර

X. බ්‍රහ්ම

02

I. නරසීහ ගාථා

II. පා දෝවනයට ජලය තැබූ භාජනය හා කැඩපත

III. කීකරුකම/ඇත්ත කතා කිරීම/හරි වැරදි හඳුනා ක්‍රියා කිරීම/අනතිමානිබව/අවවාද පිළිගැනීම

03

I. පාසල් ගීතය හා පාසල් කොඩිය

II. නැණවත්බව, උත්සාහය, එක මවකගේ දරු පිරිසක් මෙන් ක්‍රියා කිරීම

III. ජාතික කොඩිය රැගෙන යාමේ දී එහි යෂ්ටිය ඍජු ව තබා ගැනීමකිරීම

හුදු විනෝදය උදෙසා පරිහරණය නොකිරීම

කිසිදු අවස්ථාවක එය බිම නොතැබීම

ජාතික කොඩිය ඔසවන අවස්ථාවේ දී සියලු දෙනා ම නැඟී සිට සීරුවෙන් සිටීම

ජාතික කොඩිය එස වූ විගස ජාතික ගීය ගායනය

සිංහ රූපයේ පාද පහළට සිටින සේ කොඩිය එසවීම

හානියට පත් වූ හෝ අවලස්සන වූ කොඩියක් නොඑසවීම

04

I. **සබ්බෙ තසන්ති දණ්ඩස්ස** - සබ්බේසං ජීවිතං පියං

අත්තානං උපමං කත්වා - **න හනෙය්‍ය න ඝාතයෙ**

II. සියල්ලෝ ම දඬුවමින් තැති ගනිති. සියල්ලෝ ම ජීවිතයට ප්‍රිය වෙති.

එහෙයින් තමා උපමා කොට අනුන් නොමරන්න නොමරවන්න

III. සුවසේ නිදයි/සුවසේ පිබිදෙයි/පාපී සිහින නොදකියි/මනුෂ්‍යයන්ට ප්‍රිය වේ/ මුහුණ පැහැපත වේ/

අමනුෂ්‍යයන්ට ද ප්‍රිය වේ/දෙවියෝ රකී/සිත ඉක්මනින් සමාධිගත වේ/

ගින්නෙන්, වස විසෙන්, අවි ආයුධවලින් හානි නොවේ

05

I. සුමන සාමණේරයන් වහන්සේ

II. ඉසුරුමුණිය (ඉස්සරසමණ), වෙස්සගිරිය, චේතියගිරිය

III. නිර්මල ථේරවාද බුදු දහම/විධිමත් පුද පූජා ක්‍රම/භික්ෂු සමාජය/සර්වඥ ධාතූන් වහන්සේලා/

ස්තූප ඉදිවීම/දුමින්දාගමනය සිදු වීම

06

I. මූලික වතාවත්

II. මළුපෙත් ඇමදීම/පරමල් ඉවත් කිරීම/මකුළුදැල් ඉවත් කිරීම/විහාර මළුව පිරිසිදු කිරීම

III. වන්දාමි චේතියං සබ්බං - සබ්බඨානේසු පතිට්ඨිතං

සාරීරිකධාතු මහා බෝධිං - බුද්ධ රූපං සකලං සදා

07

I. අමූලිකා හා ආකාරවතී

II. සිල්වතුන් දැකීමට කැමතිය//දහම් ඇසීමට කැමත්ත තිබේ/පරිත්‍යාග කිරීමට කැමත්ත තිබේ

III. අ. අමදිනවා ආ. වඩිනවා ඉ. දැහැත්

ඊ. ගිලන්පස උ. පැන් පහසුවනවා


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න